# කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2012

2015 පෙබරවාරි

**BCOME 2054** - සාර්ව ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව - හතයි (07) කාලය - පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. " සාර්ව ආර්ථික විද්‍යාව මගින් ආර්ථිකයක් සමස්ථයක් ලෙසට ගෙන එහි ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කරයි. " ඔබගේ පිළිතුර හේතු සහතිව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. සාර්ව ආර්ථික විද්‍යාවේ සීමාවන් කවරේද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. අ. දළ ජාතික නිෂ්පාදිතය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. අංශ 03 ක ආර්ථිකයක ආදායම්, වියදම් වෘත්තාකාර ප්‍රවාහය සටහනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. ආදායම් වියදම් වෘත්තාකාර ප්‍රවාහයට විදීම් සහ කාන්දු වීම් කෙසේ බලපායිද ?

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

03. අ. මූල්‍ය ප්‍රතිපත්තිය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ?

(ලකුණු 05)

ආ. කේන්සියානු න්‍යායේ මුදලට ඇති ඉල්ලුම පිළිබඳ ප්‍රධාන අඩුලුහුඩුකම් මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. " සාර්ව ආර්ථික ඉලක්කයන් ලඟාකර ගැනීමේ දී ෆිස්කල් ප්‍රතිපත්තිය ප්‍රබල මෙවලමකි. " ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. අ. LM වක්‍රය හඳුන්වන්න.

(ලකුණු 04)

ආ. කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් ඔබට පහත තොරතුරු සපයා ඇත.

| | | |
|---|---|---|
| පරිභෝජනය | C | $= 225 + 0.7\ Yd$ |
| ආයෝජන වියදම් | I | $= 150$ |
| රාජ්‍ය වියදම් | G | $= 80$ |
| බදු | Tx | $= 30.02\ Y$ |
| සංක්‍රාම වියදම් | Tr | $= 60$ |
| අපනයන | X | $= 50$ |
| ආනයන | M | $= 25 + 0.1Y$ |

Y ආදායම වන අතර Yd වැයකළ හැකි ආදායම වේ. ( සියලුම අගයන් රුපියල් මිලියන වලිනි. )

පහත ඒවා ගණනය කරන්න.

i. සමතුලිත ජාතික ආදායම

ii. සමතුලිත ජාතික ආදායමේදී පරිභෝජනය

iii. සමතුලිත ජාතික ආදායමේදී ශුද්ධ අපනයන

iv. රජයේ වියදම රු. මිලියන 50 කින් ඉහළ ගියහොත්, නව සමතුලිත ජාතික ආදායම.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)

05. අ. ආර්ථික වර්ධනයට උද්ධමනය බලපාන්නේ කෙසේද ?

(ලකුණු 07)

ආ. උද්ධමනය සහ සේවා නියුක්තිය අතර ඇති සබඳතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. සේවා වියුක්තියේ විවිධ ප්‍රභේදයන් විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. අ. ගෙවුම් ශේෂය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ?

(ලකුණු 05)

ආ. ස්ථාවර විනිමය ප්‍රතිපත්තියට විරුද්ධව ඇති තර්ක මොනවාද ?

(ලකුණු 07)

ඇ. ආර්ථිකයකට වඩා යෝග්‍ය වන්නේ ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක්ද ? එසේත් නැත්නම් පාවෙන විනිමය අනුපාත ක්‍රමයක්ද ? පාවෙන විනිමය අනුපාත ක්‍රමයක වාසි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

07. කෙටි සටහන් ලියන්න.

අ. සමස්ත ඉල්ලුම සහ සැපයුම

ආ. ෆිලිප්ස් වක්‍රය

ඇ. කේන්සියානු ප්‍රවේශය

ඉ. පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය

(මුළු ලකුණු 20)